සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

சுகாதாரம், போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு

# Ministry of Health, Nutrition & Indigenous Medicine

## <u>රැකියා විස්තරය</u>

| A. තනතුරේ විස්තරය | |
|---|---|
| **A1. තනතුර**: වෛද්‍ය නිලධාරී (සහන සත්කාර සේවාව) | **A2. වැටුප් කේතය** : |
| **A3. ආයතනය** : සෞඛ්‍ය අමාත්‍යාංශය | **A4. දෙපාර්තමේන්තුව / අංශය** : තෘතියික හෝ ද්විතියික සත්කාර සපයන රෝහල් |
| **A5. සේවා වර්ගීකරණය** : ශ්‍රී ලංකා වෛද්‍ය සේවාව | **A6. ශ්‍රේණිය / පන්තිය**: වෛද්‍ය නිලධාරී (ශ්‍රේණිය I /II ) |

**A7. රැකියා සාරාංශය** :-

විශේෂඥ ඒකකවලින් (පිළිකා, වකුගඩු, ස්නායු, හෘද, රක්තවාතය, සාමාන්‍ය වෛද්‍ය ප්‍රතිකාර, ළමාරෝග ආදි) යොමු කරනු ලබන රෝගීන්ට සහන සත්කාර උපදේශන සේවාව භාර විශේෂඥ වෛද්‍යවරයාගේ අධීක්ෂණය යටතේ සහන සත්කාර සේවය ලබා දීම.

රෝග ප්‍රතිකාර සහ මහජන සෞඛ්‍ය ආයතන යන දෙඅංශ සම්බන්ධීකරණයෙන් සහ අනෙකුත් සංවිධාන සමග ප්‍රජා මට්ටම දක්වා  සහන සත්කාර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

| B. භූමිකාව / වගකීම් | |
|---|---|
| **B1. ප්‍රධාන ප්‍රතිඵල ක්ෂේත්‍රයන් / ප්‍රධාන වගවීම්**<br><br>1 .සහන සත්කාර අවශ්‍ය රෝගීන්ට සායනික සහන සත්කාරය ලබා දීම<br>2. රෝහල් මට්ටමින් සහන සත්කාරය ලබා දීම සඳහා සම්බන්ධීකරණය කිරීම<br>3. බහුවිධ කණ්ඩායම් රැස්වීම් සහ සහන සත්කාර කණ්ඩායම සමග සම්බන්ධ වෙමින් පවුල් සඳහා රැස්වීම් සංවිධානය කිරීම<br>4. ප්‍රජා මට්ටම දක්වා සහන සත්කාරය අවශ්‍ය වන රෝගීන්ට එම සත්කාරය අඛණ්ඩව ලබාදීමට අවශ්‍ය සම්බන්ධීරකණය කිරීම<br>5. සහන සත්කාරය ලබා දීමට කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වා ගෙන යාම | **B2. ප්‍රධාන කාර්ය සාධන දර්ශක**<br><br>1. මසක් තුලදී සහන සත්කාරය ලබාදුන් රෝගීන්ගේ සංඛ්‍යාව - අළුත් රෝගීන් සහ පෙර සිටම සහන සත්කාරය ලබන රෝගීන්<br>2. හවුල් සත්කාර සැලැස්ම සමග ප්‍රාථමික සත්කාරයට යොමු කරනු ලැබූ රෝගීන්<br>3. සහන සත්කාරය අවශ්‍ය වන රෝගීන් කළමනාකරණය කරනු පිණිස සංවිධානය කරන ලද බහුවිධ රැස්වීම්<br>4. සහන සත්කාරය අවශ්‍ය වන රෝගීන්ගේ පවුල් සඳහා සංවිධානය කරන ලද පවුල් රැස්වීම්<br>5. සහන සත්කාරය මුල් කරගෙන සංවිධානය කරන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව |
| **B3. අධීක්ෂණ වගකීම් (සෘජු සහ වක්‍ර)**<br>තමන් යටතේ සේවය කරන කාර්ය මණ්ඩලය තාක්ෂණිකව අධීක්ෂණය කිරීම | |

**B4. කාර්යයන් / ක්‍රියාකාරකම් (රාජකාරි ලැයිස්තුව)**

1. විශේෂඥ ඒකකවලින් යොමු කරනු ලබන රෝගීන්ට සහන සත්කාර උපදේශන සේවාව භාර උපදේශකවරයාගේ අධීක්ෂණය යටතේ සහන සත්කාර සේවාව ලබා දීම.

2. රෝග ප්‍රතිකාර සහ මහජන සෞඛ්‍ය ආයතන යන දෙඅංශ සම්බන්ධීකරණයෙන් සහ අනෙකුත් සංවිධාන සමග ප්‍රජා මට්ටම දක්වා සහන සත්කාර ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම.

- ප්‍රාථමික වෛද්‍ය ප්‍රතිකාර ආයතන (ප්‍රාදේශීය රෝහල් සහ ප්‍රාථමික වෛද්‍ය සේවා ඒකක) සමග සම්බන්ධීකරණය කිරීම.
- වෛද්‍ය නිලධාරී - බෝනොවන රෝග, වෛද්‍ය නිලධාරී - මානසික සෞඛ්‍ය, ප්‍රාදේශීය අධීක්ෂණ මහජන සෞඛ්‍ය හෙද නිලධාරී, දිස්ත්‍රික්කයේ සෞඛ්‍ය අධ්‍යාපන නිලධාරී සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී සමග සම්බන්ධීකරණය කිරීම.
- අනෙකුත් පළාත් සහ දිස්ත්‍රික් රජයේ නිලධාරීන් (උදා: දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, සමාජ සේවා නිලධාරී වැනි) සමග සම්බන්ධීකරණය
- සහන සත්කාරය ලබා දීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන සහ ප්‍රජා මූලික සංවිධාන සමග සම්බන්ධීකරණය කිරීම.

3. රෝහලේ රෝගී නාමලේඛණය සහ සහන සත්කාරය හා සම්බන්ධ අනෙකුත් අදාල කළමනාකරණ තොරතුරු පද්ධතිය පවත්වා ගෙන යාම

4. සහන සත්කාරයේ යෙදෙන සෞඛ්‍ය කාර්ය මණ්ඩලය, රෝගීන් රැකබලාගන්නන්, ස්වේච්ඡා ක්‍රියාකාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කර එවන් වැඩසටහන් සඳහා සම්පත් දායකයෙකු වීම

5. විශේෂඥ වෛද්‍යවරයා හෝ ප්‍රධානියා, ආයතන ප්‍රධානියා නියම කරන වෙනත් රාජකාරි වෙතොත් ඒවා ඉටු කිරීම

---

**C. <u>පුද්ගල අවශ්‍යතාවයන්</u>**

**C1. අවම අධ්‍යාපන සුදුසුකම්:**

MBBS හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත් ඊට සමාන සුදුසුකමක්

සුදුසුකම් ලත් පුද්ගලයන් සිටින විට කොළඹ විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි වෛද්‍ය ආයතනයේ සහන සත්කාර පශ්චාත් ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ වෛද්‍ය නිලධාරීන් පත් කළ යුතුය.

ඉහත සඳහන් පශ්චාත් උපාධිය ඇති වෛද්‍ය නිලධාරීන් ලැබෙන තෙක් අත්දැකීම් සහිත වෛද්‍ය නිලධාරීන් පත් කෙරෙනු ඇත.

**C2. අවශ්‍ය කුසලතාවයන් :**

රෝගීන්ගේ ශාරීරික, මානසික, සාමාජීය සහ ආධ්‍යාත්මික පැතිකඩයන් හා සම්බන්ධ සහන සත්කාර අවශ්‍යතාවයන් කලින්ම හඳුනා ගැනීම

රෝගී සත්කාරය පුළුල් හා සාකල්‍ය කෝණයෙන් යෙදවීමට අවශ්‍ය සායනික කුසලතා (රෝගීන් සඳහා වන සායනික සත්කාරය)

සන්නිවේදනය සහ උපදේශනය

සත්කාරයේ විවිධ මට්ටම්වල ඵලදායී සම්බන්ධීකරණය

නායකත්වය

පර්යේෂණය

**C3. දක්ෂතා (සාමාන්‍ය සහ වෘත්තීමය)**

සත්කාර ලබා දෙන්නන්, සන්නිවේදකයන්, වියතුන්, සහකාරකයින්, කළමනාකරුවන්

**C4. රැකියාවට බලපෑම් ඇති කරන විශේෂ තත්ත්වයන්, එය හා සම්බන්ධ අවදානම සහ සේවා වාතාවරණය**

වෛද්‍ය වෘත්තිකයින්, රාජ්‍ය නිලධාරින් සහ රාජ්‍ය නොවන සංවිධානද ඇතුළුව රෝහලේ අනෙකුත් ඒකක සහ වෙනත් සෞඛ්‍ය සත්කාර ආයතන සමග ප්‍රජා මට්ටම දක්වා සහයෝගයෙන් කටයුතු කිරීම.

**C5. සේවා ප්‍රමිති:**

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති ප්‍රමිතීන්ට (මාර්ගෝපදේශ) වලට අනුකූලව කටයුතු කිරීම

**C6. වටිනාකම් සහ අචාරධර්ම :**

සහන සත්කාරය සපයන වෛද්‍ය නිලධාරින් වෛද්‍ය වෘත්තියේ ආචාරධර්ම වලට අනුකූලව කටයුතු කරනු ඇත.

රෝගීන්ගේ, ප්‍රජාවගේ මෙන්ම තමන් සමග රාජකාරි කරන අනෙකුත් වෘත්තිකයන්ගේ සහ රෝහල් කාර්ය මණ්ඩලයේ ගරුත්වය රකිමින් හා ඔවුන්ට ගරුකරමින් කටයුතු කළ යුතුය.

රෝගීන් කළමනාකරණයේදී රහස්‍යභාවය සහතික කිරීම

**C7. සම්පත් සහ පහසුකම් පිළිබඳ වගකීම:**

රජයේ සම්පත්වලින් උපරිම ප්‍රයෝජනය ගනිමින් නාස්තිය අවම කළ යුතුය

**C8. රාජකාරි වේලාවන් :**

සතියේ දිනවල පෙ.ව 8.00 සිට දහවල් 12.00 දක්වා සහ ප.ව 2.00 සිට ප.ව 4.00 දක්වා

සති අන්තය - සෙනසුරාදා පෙ.ව 8.00 සිට දහවල් 12.00 දක්වා

---

**D. මූලික සබඳතා**

| | |
|---|---|
| **D1. අනුමැතිය ලබා දෙන බලධාරියා:**<br>රෝහල් අධ්‍යක්ෂක හෝ අධිකාරීවරයා | **D2. වාර්තා කළ යුත්තේ:** සහන සත්කාර සේවාව භාර විශේෂඥ වෛද්‍යවරයා |
| **D3. සහායක කාර්ය මණ්ඩලය:**<br>සහන සත්කාර වගකීම දරන හෙද නිලධාරීන්<br><br>සහන සත්කාර උපදේශන සේවාවේ ලේඛන කටයුතු පවරා ඇති සංවර්ධන නිලධාරියා හෝ වෙනත් නිලධාරියෙකු | |

**D4. අනුමත කළේ:**

........................................................

ලේකම්, සෞඛ්‍ය, පෝෂණය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය
දිනය: